**කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ ගංගාරාම විහාරයේ ඉඩම් භුක්තිය.**

අජිත් තල්වත්ත,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්‍ය්‍ය,
මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය,
සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ
ajiththalwatte@gmail.com

දහඅට වැනි සියවසේ කන්ද උඩරට රාජධානියේ සිදු වූ බෞද්ධාගමික පුනර්ජීවනයේ එක් පැතිකඩක් ලෙස දිවයින පුරා පිහිටි විහාරස්ථාන රැසකට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ඍජු අනුග්‍රහය ලැබීම පෙන්වාදිය හැකිය. රාජ අනුග්‍රහය ලද විහාරස්ථාන විශාල ප්‍රමාණයක් උඩරට රාජ්‍යයේ අවට පිහිටා තිබේ. මේ අවධියේදී අලුතින් ඉදිකරන ලදැයි හෝ නැතිනම් ප්‍රතිසංස්කරණය කරන ලදැයි හෝ සැලකෙන වෙහෙර විහාර මහනුවර හා තදාසන්න ප්‍රදේශවල දක්නට ඇත. ***මහාවංශයේ*** [1] සහ **සුළුරාජාවලියේ** [2] සඳහන් තොරතුරුවලට අනුව එම විහාරස්ථාන මොනවාද? යන්න අවබෝධ කරගත හැකිය. මෙම මූලාශ්‍රවල සඳහන් තොරතුරුවලට අමතරව ගංගාරාම විහාර ශිලා ලිපිය, මැදවල සන්නස, දඹුලු වෙහෙර තුඩපත සහ දඹුලු පදවි සන්නස වැනි සමකාලීන වෙනත් ලේඛන රැසකිනුත් මෙකල ඉදි කරන ලද වෙහෙර විහාර පිළිබඳ අවබෝධයක් ලැබේ.[3] පුරාණයේ සිටි පාලකයෝ සෑම අවස්ථාවක දීම වෙහෙර විහාරස්ථානවලට විවිධ ප්‍රදාන සිදු කර ඇත. පැරණි යුගවල සිංහල සමාජ තුළ රජු භූමියේ අධිපතියා ලෙස පිළිගැනිණ. ඔහු භූපති, භූමිපාල හා භූමිපා වැනි යෙදුම්වලින් හඳුන්වන ලදී.[4] එච්. ඩබ්ලිව්. කොඩ්රිංටන්, විල්හෙල්ම් ගෛගර් සහ ටිකිරි අබේසිංහ වැනි විද්වතුන් බොහෝදෙනකු විසින් රජු රාජ්‍යයේ සියලු ඉඩම්වල හිමිකරු වී යන අදහස ඉදිරිපත් කොට ඇත. නමුත් මහාචාර්ය ඉන්ද්‍රකීර්ති සිරිවීරගේ අදහස වූයේ රජු භූමියේ අධිපතියා ලෙස සැලැකීමෙන් අදහස් කළේ රජුට රටේ සිටලුම ඉඩම් අයිති වූ බව නොවේ.[5] ජනතාවට ඉඩම් මිල දී ගැනීමට, ප්‍රදානය  කිරීමට සහ විකිණීමට අයිතියක් තිබිණ. සාමාන්‍ය පුද්ගලයන් අතර ඉඩම් විකිණීම්, ප්‍රදානය කිරීම්, මිල දී ගැනීම් වැනි ගනුදෙනු සිදු වූ අවස්ථා කිසිවක දී රජුගේ අවසරය ඒ සඳහා අවශ්‍ය නොවීය. මේ අනුව පැහැදිලි වන්නේ රජතුමා පෞද්ගලිකව භුක්ති විඳි ඉඩම් පැවති අතර, රජු පුද්ගලයන්ගේ භුක්තියට පැවරි තිබූ ඉඩම් පිළිබඳ හිමිකමට ගරු කිරීමත් දක්නට ලැබුණු බවයි. රජතුමා විවිධ පුද්ගලයන්ට, නිලධාරීන්ට හා විහාරාරාමවලට ඉඩම් ප්‍රදානය කළේය.

ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකම පිළිබඳ රටාවේ වැදගත් ස්ථානයක් ආගමික සංස්ථාව විසින් දරන ලදි. බෞද්ධ සංඝයාට හා විහාරවලට රජු විශාල වශයෙන් ඉඩම් ප්‍රදානය කළේය. මේ නිසා ලංකාවේ බෞද්ධ විහාරාරාමික සංස්ථාව විශාල ඉඩම් හිමි ආයතනයන් ලෙස ඓතිහාසික විකාශනයකට භාජනය විය.[6] විහාරාරාමවලට ඉඩම් ප්‍රදානය කළ විට එම විහාරය තමන්ට ලැබුණු ඉඩම්වලින් සේවාවන්, බදු හා ආදායම් ලබාගත්තේය. විහාරාරාමවලට ලැබුණු ප්‍රදානයන්ට ඉඩම් පමණක් නොව වාරි කර්මාන්ත සහ වෙනත් ආදායම් ලැබිය හැකි මාධ්‍යයන් ද ඇතුළත් විය.

රජු භූමියේ පාලකයා වුවත් ඔහු ඉඩම් පිළිබඳ කරුණුවල දී සිය හිතුමානපයේ ක්‍රියා කළ පාලකයෙකු නොවීය. රාජධානියේ ඉඩම් පිළිබඳ ව ඔහු සතු සැලකිය යුතු අයිතිවාසිකම් පැවති බව මෙයින් අදහස් වෙයි. ඉන් විහාරස්ථානයේ අභිවෘද්ධියට ඉඩම් ප්‍රදානය කිරීම සුවිශේෂී වේ. මෙම පරිච්ඡේදයෙන් ප්‍රධාන වශයෙන් සාකච්ඡා කරන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි විහාරස්ථාන උදෙසා සිදු කරන ලද ඉඩම් ප්‍රදානය, අනුග්‍රහය කෙසේ සිදු කර ඇත්දැයි හඳුනාගැනීමටත් ඒ හා බැඳුණු රාජකාරී සේවාවන් විමසීමටත් ය.

විදේශීය රාජවංශයක පාලකයෙකු ලෙසින් ද හින්දු ආගමිකයෙකු වශයෙනුත් සිටි කීර්ති ශ්‍රී රාජසිංහ බෞද්ධාගම වෙත මෙතරම් නැඹුරුව ක්‍රියා කළේ ඇයි ද? යන්න විමර්ශනය කළ යුතුය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු බාහිර වශයෙන් ස්වකීය රාජ්‍ය පාලන කටයුතුවලදී මුහුණ දුන් අභියෝගය වූයේ ලන්දේසීන්ගේ සිදු වූ බලපෑමයි. ඊට උඩරට රාජධානියේ ඔහුට අභියෝගාත්මක පරිසරයක් නිර්මාණය වී තිබිණ. අන්‍ය අවධින්හිදී මෙන් රටවැසියාගේ පක්ෂපාතීභාවය මේ රජුට නිරායාසයෙන් ම ලැබුණු බවක් නොපෙනේ. උප්පත්තියෙන්, පරපුරෙන් හෝ සංස්කෘතික වශයෙන් මේ රජු සිංහල බෞද්ධ පාලකයෙකු නොවීමත් දෙමළ බස කථා කළ මිථ්‍යා දෘෂ්ටික හින්දු බැතිමතෙක් වීමත් මෙහිදී තීරණාත්මකව බලපෑවේ ය. එනිසා උඩරට රාජධානියේ සිටි බහුතර සිංහල ජනයා අතර මෙම පාලකයා විදේශීය රජෙකුගේ තත්ත්වයෙන් ම සිතන්නට වූ බව දක්නට නොලැබේ.[7]

මේ රජුගේ කාලයෙහි දී බෞද්ධ දෘෂ්ටියට සහ බෞද්ධාගමික හැඟීම්වලට තම කැපවීම මෙරට සිංහල රටවැසියාට එත්තු ගැන්වීම සඳහා දැරූ උත්සාහය නිසා මෙකල ශ්‍රී ලංකාවේ බුදදහම නැවුම් මුහුණුවරක් ගත්තේය. බෞද්ධාගම පුනර්ජීවනය කොට එහි පෞරාණික ස්වරූපයන් නැවත ප්‍රතිෂ්ඨාපනය කළ අතර එය ලංකා ඉතිහාසයෙහි දී අවසන් වතාවට සිදු වූ බව පෙනේ.[8] ඒ වන විට නැතිව ගොස් තිබූ උපසම්පදාව පිහිටුවීම උසස් ම සේවාව වශයෙන් හඳුනාගත හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස බුදුදහම කන්ද උඩරට රාජධානියෙන් ඔබ්බට පැතිර යෑම සුවිශේෂී අවස්ථාවකි. ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදාය ආරක්ෂා කිරීම ලංකාවේ භක්තිමත් බෞද්ධ රජෙකුගේ යුතුකමක් ලෙසට සැලකුණු බැවින් බුදු දහමේ ආරක්ෂකයා ලෙස පෙනී සිටීමට ඔහු කැපවී සිට බව හැඟවීමට උත්සාහ දරා තිබේ. එනිසා ඇතැම් විද්වතුන්ගේ මතය වන්නේ හුදෙක් තම දේශපාලනික අභිමතාර්ථ සාධනය කර ගැනීම සඳහා පමණක් ම බෞද්ධාගමික පුනර්ජීවනය පවත්වාගෙන ගිය බවකි.[9] එවැනි චෝදනාවක් පැවතුණ ද බෞද්ධ ප්‍රජාව විසින් ඉතා ඉහළින් අනුමත කරනු ලැබූ ආකාරයට කටයුතු කිරීමත් තම පෞද්ගලික මතය හා ආර්ථික ශක්තිය ප්‍රයෝජනයට ගැනීමත් මෙකල ඔහුට අවශ්‍ය දේශපාලන හා ආගමික පසුබිම සකස් කොට ඇති බව පෙනේ.

ස්වකීය බලය තහවුරු කරගත් කිර්තී ශ්‍රී රාජසිංහ රජුගේ සුවිශේෂී ක්‍රියාදාමයන් වූයේ විහාර හෝ දේවාලවලට රාජ අනුග්‍රහය ලබාදීමේ දී ඉඩම් ප්‍රදාන සිදු කිරීමයි. විශේෂයෙන් ම බෞද්ධ විහාර සඳහා විශාල ඉඩකඩම් ප්‍රදානය කිරීම බුද්ධාගම ලක්දිවට පැමිණීමෙන් පසුව ශීඝ්‍රයෙන් සිදු වූ බව පැහැදිලි ය.[10] බුද්ධාගම රාජ්‍යාගම වීමත්, වැසියා බෞද්ධයින් වීමත් නිසා රජවරු බුද්ධාගමේ ආරක්ෂකයින් ලෙස කටයුතු කළහ. උඩරට ප්‍රදේශවල මෙතරම් විහාර සන්තක ඉඩම් රාශියක්

බිහිවීමට නායක්කර්වරුන්ගේ ආගමික ප්‍රතිපත්තිය ද හේතු විය. බොහෝ අවස්ථාවල දී ඉඩකඩම් පන්සලට පවරන ලද්දේ අක්කර සිය ගණනින් නොව දහස් ගණනිනි. විශේෂයෙන් ම ක්‍රි.ව. 1815 වර්ෂයේහිදී බ්‍රිතාන්‍යයින් උඩරට රාජ්‍යය අල්ලාගන්නා ලද අවස්ථාව වන විට මෙරට විහාර හා දේවාල සතු ඉඩකඩම් අක්කර 675237 ක් පමණ පැවති බව කියැවෙන අතර[11] මේවායින් වැඩි ප්‍රමාණයක් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේදී ප්‍රදානය කොට ඇති බව සමකාලීන ඉඩම් ප්‍රදාන ලේඛනවලින් හොඳින් පැහැදිලි වේ.[12] කන්ද උඩරට ප්‍රදේශයේ කුඹුරු ඉඩම්වලින් 1/3 ක් විහාරයන්ට අයත්ව තිබුණා යැයි ප්‍රයිඩ්හැම් 1844 දී ඇස්තමේන්තු කළේය.[13] මෙම ඇස්තමේන්තුව නිවැරදි ද? යන්න පැහැදිලි නැතත් විශාල ඉඩම් ප්‍රමාණයක් විහාර දේවාලවලට හිමිව තිබූ බව විශ්වාස කළ හැකිය. හක්ගෙඩිය පිඹීම හෝ ලෝකඩ තම්මැට්ටම ගසා එහි හඬ යම් තාක් දුරට විහිද ගියේ ද? ඒ තාක් දුර ප්‍රමාණයක පිහිටි ඉඩකඩම් සියල්ල පන්සලට පූජා කරන ලදී.[14] රජුගේ අනුග්‍රහය ලත් මෙබඳු විහාරස්ථාන " රජ මහා විහාර" නමින් හැඳින්විණ.

**ගංගාරාම විහාරය**

කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ ඉදි වූ සුවිශේෂ විහාරස්ථානයක් ලෙස ගංගාරාම විහාරය සඳහන් කළ හැකිය. මහවැලි නදිය අසබඩ පිහිටි මෙම විහාරය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් සිදු කරන ලද සේවාවන්ට ජීවමාන සාධකයක් වෙයි. මෙම රජතුමා මහනුවර ප්‍රදේශයේ ඉදි කරන ලද පළමුවැනි විහාරය ලෙසට සැලකෙන මෙය මහනුවර රාජධානියෙහි කේන්ද්‍රය ලෙසට පැවති, පස්රට නැමැති ඒකක පහෙන් දුම්බර රටෙහි පිහිටි ඉපැරණි විහාරස්ථානයකි.[15] මෙම විහාර කර්මාන්තය ඉදි කිරීම පිළිබඳ තොරතුරු රැසක් ද **මහාවංශයේ** අන්තර්ගතව පවති. ගංගාරාම විහාරය වර්තමානයේ පවා මල්වත්තේ මහ පදවිය හා සම්බන්ධව පවතින ස්ථානයකි.[16] මල්වතු විහාරීය භික්ෂූන් වහන්සේලා ආදාහනය කරන ස්ථානය වශයෙන් ද ප්‍රකට මෙම විහාරය සරණංකර යුගයේදී අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙස ද ජනප්‍රියව පැවතිණ. සිව් දිසාවෙන් දළදා වැඳීමට හෝ උපසම්පදාවට මහනුවරට පැමිණෙන භික්ෂූන් වහන්සේ නතර වූ ස්ථානයක් ලෙස ද ගංගාරමය වැදගත් වේ. මහවැලි ගං ඉවුරෙහි මනරම් භූමි භාගයෙහි ගොඩනැගූ හෙයින් ම ගංගාරාමය යැයි ප්‍රසිද්ධ විය.

මෙම විහාරය ඉදි කිරීම පිණිස කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ දීර්ඝ විස්තරයක් **මහාවංශයෙහි** අන්තර්ගතව පවතී. ඒ සඳහා ගාථා 36ක් පමණ වෙන් කර ඇත. "ශ්‍රී වර්ධනපුරයෙහි නැගෙනහිර දිග ඉතා දුරු නොවූ හෙබනා තැන සුපිහිටි ගලෙක ගල්වඩුවන් ආදී වූ දක්ෂ කම්කරුවන් ලවා නව රියන් උස් වූ උතුම් සිරියෙල් බුදු පිළිරුවක් මනාකොට කරවා ඒ පිළිරුව රන් පටින් වස්සවා දිව්මනු බුදුන් බඳු ඒ බුදුරුව ඇතුළ් කොට උස් ගන ගල්බිත්ති කරවා මනහර ගල්ටැම ගිදුවා[17] ..... යනාදී වශයෙන් සඳහන් වේ. මෙම විහාරස්ථානය ඉදි කිරීමට රජු ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තරයක් **සුළුරාජාවලියෙහි** මෙසේ සඳහන් වේ. "තවද ශ්‍රී වර්ධනපුරයට පූර්ව දිශාභාගයෙහි රමණීය භූමිභාගයෙක් හි සුප්‍රතිෂ්ඨිත වූ පර්වතයෙන් සිලාකෝට්ටයන් ලබා වඩු නව රියන් උස වැඩසිටින [18].................

ගංගාරාම විහාරය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේදී එම විහාරය ඉදිරිපස ඇති ශිලා ලිපියත් ***මහාවංශයේ*** විස්තරවලට අනුව මෙම විහාරය ඉදි කළ කාල වකවානුව පිළිබඳ අවබෝධයක් ලැබේ. ක්‍රි.ව. 1747- 1780 අතර කිසියම් කාලයකදී ඉදි කරන ලද කෙනෙකුගේ මතය වී ඇති නමුත්[19] එම විහාර භූමියෙහි පිහිටුවා ඇති ශිලා ලිපියට අනුව නේත්‍ර ප්‍රතිෂ්ඨාපනය සහ සිතුවම් ඇඳීම ක්‍රි.ව. 1752 වර්ෂයේදී සිදු කොට ඇති බව පෙනෙන බැවින් මෙම විහාරයේ වැඩ කටයුතු සියල්ල කීර්ති ශ්‍රී රජු දවස ක්‍රි.ව. 1752 වර්ෂයේදී හෝ ඊට මඳක් පෙර වසරකදී හෝ අවසන් කොට ඇති බවට මහාචාර්ය මහින්ද සෝමතිලක පෙන්වා දී ඇත.[20] මෙම විහාරය ලන්දේසි ආක්‍රමණවලට ලක් වී විනාශ වූ අතර නැවත කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ බව **මහාවංශයේ** සඳහන් වේ.[21]

ගංගාරාම විහාරය කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ ඉදි කරන ලද නමුත් එහි ඉතිහාසය ඊට පෙර අවධියකට දිව යන බව පෙනේ. මෙහි ඇති ප්‍රධාන ප්‍රතිමාව අනුරාධපුර යුගයට අයත් එකකැයි හෝ අනුරාධපුර සමයට අයත් වන ප්‍රතිමා ශෛලියෙන් එය නිම කොට ඇතැයි හෝ සලකනු ලැබීමෙන් ද මේ බව තහවුරු වේ.[22] ශෛලිය අවධීන් දෙකක සිටි කලාකරුවන් දෙදෙනෙකු නිම කළ ද එය නිශ්චිත කාල නිර්ණයක් කිරීමට ප්‍රමාණවත් නොවේ. අලංකාර විහාර මන්දිරයක ඉදි කර ඇති වැඩ හිඳින ප්‍රතිමාව අවුකන පිළිමයට යම් සමානත්වයක් පෙන්නුම් කරයි. නමුත් ගංගාරාම පිළිමෙහි බදාමයකින් වසා හුණු පිරියම් කර ඇත. පිළිමය දෙපස සැරියුත්, මුගලන් නිරූපණය කර තිබීම ද ඉතා වැදගත් අවස්ථාවකි. අලංකාර සිතුවම් විශාල ප්‍රමාණයක් විහාර අභ්‍යන්තරයේ දක්නට ලැබේ. උඩරට සිතුවම් සම්ප්‍රදායට අයත් චිත්‍ර රැසක් ද මෙහි ඇත.

ගංගාරාම විහාරයේ අභිවෘද්ධියට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් සිදු වූ සේවා අතර ඉඩම් ප්‍රදානය කිරීම ද ඉතා වැදගත් වේ. විහාරයේ අභිවෘද්ධිය ලබා දුන් ඉඩම්වල පිහිටි ප්‍රදේශ සහ විහාර කර්මාන්තය නගා සිටුවීමට උපකාර වූ ශිල්පීන්ට විවිධ ප්‍රදානයන් සිදු කර ඇත. එම ඉඩම් පිළිබඳව සාකච්ඡා කිරීමේදී ගංගාරාම ශිලා ලිපිය ඉතා වැදගත් වේ. එහි මෙසේ සඳහන් කොට තිබේ.

"........... කීර්ති -ශ්‍රී - වර රාජසිංහ වරපති සත්කීර්ති ආසිත් තදා කීර්ති ශ්‍රී රාජසිංහ එහි නිරන්තරයෙන් පුද පවත්වනු සඳහා නොයෙක් ධූරයෙහි නියුක්ත පරිවාර ජනයන් සලස්වා කෙත්වත් උව මැනවයි බිබිලේ දන්වැට කුඹුර ගැටගහකුඹුර අස්වැද්දුම ගල්පොත්තේ කුඹුර වත්තේ ආරච්චිගේ කුඹුර මෙයි බිජු හතරවුණු දෙපැලක් සහ අරුප්පලින් මීගස්කුඹුරේ මුත්තෙට්ටුව ගලහිටියා පිහිලිඅංග පුස්සේඅංග ගැටගහදෙණි අස්වැද්දුම කලාවිය කුඹුර පින්දෙණිය මෙයින් බිජු හතමුණක් හා සෙවැද්දුම්වෙල නරාලේ වෙරළුගහදෙණිය අලුපත හපුගහදෙණිය වලකුඹුර, මුරුණේපල්ලේ ගලහිටියාව, උඩගලහිටියාව, පල්කඩ දොඩම්ගහ කුඹුර යන මෙයින් බිජු දොලාසමුණු දෙපැලක් වට්ටාරන්තැන්නේ ගඩාදෙහිමඩිත්ත හපුගස්වෙල මෙයින් බිජු හාමුණු පැලක් හා බෝගවතේ බිජු හාමුණු දෙපැලක් හා හාල්මැහිකඳුරු ඇල්ල බිජු යේලමුණක් හා අම්පිටියෙන් අළුගොල්ල බිජු පස් පැලක් දුම්බරින් හතමුනේ අස්වැද්දුම බිජු දෙපැලක් හා සතර කෝරලේ දිසාවෙන් දෙයාලදහමුණපත්තුව බද දියගමින් වැලිදෙණිය ඊරියකුඹුර මාකුඹුර පට්ටාමලේ කෙරෙඹුලේ

නීලාම්ඹේ දම්ගහ දෙපෑල වැලිකුඹුර ගලහිටියාව දෙඹටමල්පෑල පල්කුඹුර අඹකුඹුර පට්ටමාලේ කෙරෙඹුලේ නීලාම්ඹේ දම්ගහ දෙපෑල වැලිකුඹුර ගලහිටියාව දෙඹටමල් පෑල පල්කුඹුර අඹකුඹුර උග්ගලේ රිටිකුඹුර මිණුන්කුඹුර මුණමලේ, හවරිකිත්තාව, බෝගහ දෙපෑල කුඹල්කුඹුර, බුන් කුඹුර, දොරකුඹුර අරබදේ අලුගොල්ල කැන්දොපේ පුරාණ මෙයින් බිජු තිසමුණක හා මෙහි බද අමුනගමින් හඳුන්ගොමුව මුත්තෙට්ටුව කිලුල්ල දම්ගහදෙණිය, මෙයින් බිජු පහමුණු දෙපෑලක් හා එහි බද දාහෙන්පඩුවෙන් ලෙනපිටිය අමුනු කුඹුර අස්වැද්දුම මෙයින් බිජු හතමුණක් සහ උඩුනුවර කඳුපළාත බද මාවරගොමුව හඳුරු කුඹුර බිජු පස්පෑල වපසරිය සුරඹාගේ වර්ග පරම්පරාවට නිරවුල්ව භුක්තිවිඳ මෙහි පෝය දින මඟුල් බෙර වයන රඟටත් යන මෙකී බිජු අසූතුනමුණු තුන්පෑලක් සහ මෙහි බද ගොඩමඩ ගෙවතු ගහකොළ ඇතුළු සියල්ල[23] . . . . යනාදී ලෙස ඉඩම් ප්‍රදානය ගැන තොරතුරු සඳහන් වේ.

එම ලිපියේ සඳහන් තොරතුරු සහ ප්‍රවේණි ලේඛනයට[24] අනුව ගංගාරාම විහාරය හා බැඳුණු නිල රාජකාරි රැසක් පවතින බව පෙනේ.

**සියඹලාගස්තැන්න හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(1) මල්මුරේ පංගුව** වෙසක් මාසයේ සිට පටන්ගෙන මාසයක් ඇර මාසයක දී එක මුරේට පිට පිට දවස් 15 බැගින් අවුරුද්දට මුර හයක් ගංගාරම විහාරේ රෑ දහල් මුර කිරීම ය. පංගුකාරයට දවාලේ සිට සවස සතර පමණට මල් කඩා හැර එන වේලාවතුරු නිවාඩු තිබේනවා ය. මුරේ සිටින විටත් තේවාව කරන සංඝයා නමට උදයට මල්වට්ටියකුත් සවසට මල් වට්ටියකුත් දීම ද විහාරේ මුළු මිදුල සුද්ධ පවිත්‍ර කිරීම ද රෑට සිට මුරකිරීම ය.

**(2) මුල්තැන් පංගුව** එක මුරේට දවස් 15 බැගින් අවුරුද්දට මුර හරතක් එනම් දවලේ සිට සවස හතර හමාර වන තුරු තිබෙන නිවාඩු ඇරෙද්දී රෑ දවල් ගංගාරාම මුරේ සිටීමත් උදැසන කැඳ ඉවීම සහ මහ දානේ ඉවීම ය. මුර කරන විට නිලකාරයාට උදයට කැඳත් දවාලට හොඳට බත්මාළු වේලකුත් ලැබේනවා ය.

**(3) හබාකොටන පංගුව** ගංගාරාම විහාරේ මාසකට පෑල බැගින් කොටා හාල් නැලි 20 ක් විහාරයට භාරදීම ද අළුත් සහල් මංගල්‍යයට එළවළු කඳත් විහාරයට දීම ද අවුරුද්දකට තුන්වතාවකට නොවැඩි වූ ගණනක් ගමන්වල දී ඕනෑ කළොත් ස්ථානගත සංඝයාගේ දෝලාව ඔසවලානේ ඇතුළත ඉසයීම ද ස්ථානගත සංඝයා නම කැටුව ගමන් යන විට නිලකාරයාට හොඳ කෑම ලැබීම ද ය.

(4) **ලුණු දෙන පංගුව** සෑම අවුරුද්දක් ලබන මාසයේ දීම ගංගාරාම විහාරයට පිරිසිදු ලුණුවලින් සේරු හතලිහක් දීම ය.[25]

**මාපනාවතුර හා සම්බන්ධ රාජකාරි සේවාව**

(5) **මුල්තැන් පංගුව** — එකමුරයකට දවස් 15 බැගින් අවුරුද්දකට මුර හතරක් ගංගාරාම විහාරේ දවල් සිට සවස හතර හමාර වනතුරු තිබෙන නිවාඩු ඇරෙද්දී රෑ දවල් මුරේ සිටීමත් හීල්ව කැඳ හා දානේට බත් මාළු ඉවීම ද මුරේ සිටින විට නිලකාරයාට උදයට කැඳත් දවල්ට හොඳ බත් මාළුවත් ලැබේනවා ය.

**(6) රාජකාරියේ පංගුව** — සෑම අවුරුදුවල ජනේරු මාසේ පළමුවෙනිදා ගංගාරාම විහාරේ ස්ථානගත සංඝයාට සිලිං හතරකුත් පැන්ස හයක බද්දකුත් ගෙවීම ය.

**අරුප්පල හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(7) මුල්තැන් පංගුව** — බක්, ඇහැල, බිනර මැදි දින යන මාසවලදී එකමුරේට දවස් 15 බැගින් අවුරුද්දකට මුර හතරෙක් ගංගාරාම විහාරේ රෑ දවල් සිටිමින් හීල්ව කැඳ සහ මහ දානේට බත් මාළු ඉවීම ද සෑම මංගල්‍යය සතරට එකිනෙකට කෙසෙල් ගහක් විහාරයට ගෙනවිත් විහාරේ සැරසිලිවලට උදව් දීම ද අළුත් සහල් මංගල්‍යයට ගුරුදෙණිය අටුවේ සිට විහාරේට හාල් කඳක් ගෙනත් දීම ද මාපනාවතුරේ මුල්තැන්කාරයාට මෙන් කෑම පංගුකාරයාටත් ලැබෙනවා ය.

**(8) මල්මුරේ පංගුව** — වෙසක් මාසයේ සිට පටන් මාසයක් හැර මාසයක එකමුරේ සිට දවස් 15 බැගින් අවුරුද්දට මුර හයක් ගංගාරාම විහාරේ දවල් සිට සවස හතර හමාරට නිලකාරයා මල් කඩාගෙන හැර එන වේලාව වනතුරු තිබෙන නිවාඩුව ඇරෙද්දී රෑ දවල් අනිකුත් සෑම වේලේ මුරේ සිටිමින් තේවාව කරන සංඝයා නමට උදයට සහ සවසට මල් වට්ටියක් බැගින් දීම ද විහාර මළුවේ මිදුල සුද්ද පවිත්‍ර කිරීම ද විහාරේ රෑට සිට මුරේ කිරීම ද ගුරුදෙණිය අටුවේ සිට හාල් කඳක් විහාරෙට ගෙනැත්දීම ද අවුරුද්දේ සතර මංගල්‍යය එකිනෙකට කෙසෙල් ගහක් දීම හා සැරසිලි කිරීමට උදව් දීම ද ය. මුරේ සිටින විට උදයට කැඳත් දවල්ට හොඳට බත් මාළුත් ලැබේ.

**(9) හබාකොටන පංගුව** — ගංගාරාම විහාරයේ වී දෙපෑලක් කොටා හාල් නැලි තිහක් විහාරයට බාරදීම ද අවුරුද්දකට තුන් ගමනකට නොවැඩිව මධ්‍යම පළාත ඇතුළත ස්ථානාධිපති සංඝයාගේ දෝලාව ඉසිලීමේ වැඩ රාජකාරිය කරන විට හොඳාකාර කෑම ලැබීම ය.

**(10)බෙරකාර පංගුව** — අවුරුද්දේ සෑම බදාදා දවස්වල ගංගාරාම විහාරේ මහාදානේ තේවාවටත් සතර මංලග්‍යයේ දී බෙර ගැසීම ද සතර මංගල්‍යය දවස්වල නිලකාරයාට මහා දානේදී හොඳට බත් මාළු ලැබෙනවා ය.

**(11) හක්ගෙඩි පංගුව** — අවුරුද්ද මුළුල්ලේ සෑම දවස්වල තේවා තුනට සහ සතර මංගල්‍යයට ගංගාරාම විහාරයේ හක්ගෙඩි පිඹීම ය.

**(12) කැඩපතේ පංගුව** ගංගාරාම විහාරේ අවුරුද්ද මුළුල්ලේ සෑම බදාදා දවස්වල තේවාව කරණ සංඝයා නම විසින් බුද්ධ ඡායාරූපය නානුමුරේ කරන විට කැඩපත ඇල්ලීම ය.

**(13) රාජකාරි පංගුව** ගංගාරාම විහාරේ සංඝයා නමට සෑම අවුරුදුවල ජනවාරි මස පළමුවෙනිදා සිලින් දෙකක් ගෙවීම ය.[26]

**තල්වත්ත හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(14) ඉටිපන්දන් පංගුව** ගංගාරාම විහාරේ පාවිච්චියට ඉටිපන්දන් දෙකක් එකවරට මාස්පතා දීමය.

**(15) හේවිසි පංගුව** බක්මාසයේ සිට පටන්ගෙන මාසයක් ඇර මාසය බැගින් අවුරුද්දකට හයමාසකදී සෑම දවස්වල ගංගාරාම විහාරේ උදය තේවාවටත් මහා දානේ තේවාවටත් සවස තේවාවටත් හේවිසි ගැසීම ය.

**(16) රාජකාරි පංගුව** අවුරුද්දකට සිලිං හතරක් ගෙවීම ය.

**(17) වලන්දෙන පංගුව** සිරිත් ප්‍රකාරව වලන් කත් අටක් ගංගාරාම විහාරේට ගෙනැත් බාරදීම ද සිංහල අවුරුදු මංගල්‍යයට පසු පළමුවෙන් ම පැමිණෙන හොඳ දවසක ස්ථානගත සංඝයා නමට අප්පල්ලා දොළහකුත් මුට්ටි දෙකකුත් දී පෙනී සිටීම ද ය.

**(18) පන්දම් අල්ලන පංගුව** (මාරු වෙනවා)[27]

**තැන්නේකුඹුර හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(19) හේනවාගේ පංගුව** ගංගාරාම විහාරේ සෑම පිලිත් එහි ආවතේව කරන්නන්ගේ පිලිත් අවුරුද්ද මුළුල්ලේ ඇපිල්ලීම ද විහාරයේ දැල්වීම පිණිස මාසයකට පාන් වැටි සියයක් බැගිනුත් කාර්ති මංගල්‍යයට වැඩිපුර පාහන්වැටි දෙසියකුත් දීම ද විහාරයේ වත් පිළිවෙත්වලට නියම කළ විට රෙදි ගෙනවිත් වියන් බැඳීම ද මංගල්‍යය සතර එකිනෙකේදී මුරේ සිටින මුල්තැන්කාරයන්ට පිරුවට හයක් දීම ය.

**(20) දරදෙන පංගුව** දවස් පතා මිනිහෙක් බරට අවුරුද්ද මුළුල්ලේ දී ම ද මංගල්‍යය සතර එකිනෙකට වැඩි බරවල් දෙකක් බැගින් දීම ද පහළොස් දවසකට වරක් මුල්තැන් ගෙයි ගෙමැද්ද හොඳාකාර ගොම ගෑම ය.

**(21) වලන්දෙන පංගුව** මාරු වෙනවා.

**නාපාන හා සම්බන්ධ රාජකාරි සේවා**

**(22) තෙල්දෙන පංගුව** මාසයකට කැකුණ තෙල් නැලි දෙකක් බැගින් අවුරුද්දකට හය මාසයක් එනම් නොවැම්බර් එක විසින් හාරමාසයකදීත් විහාරයට තෙල් දීම ය.

**(23) පුවක් දෙන පංගුව** අලුත් අවුරුදු මංගල්‍යයට ප්‍රථම පුවක් 1200 කුත් මාස හයකට කැකුණ තෙල් නැළි දෙකක් බැගින් දීම ය.[28]

**වට්ටාරංතැන්න හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(24) සිංහාරක්කාර පංගුව -** සෑම අවුරුදුවල මාසයක් ඇර මාසයක් බැගින් වෙසක් මාසයේ සිට හය මාසයක් ගංගාරාම විහාරේ මුර සිටිමත් දවස් පතා කරන තේවාවන්ට හේවිසි ගැසීම ද පින්කම්වලට ස්ථානගත සංඝයා කැටුව යෑම ද මුර කරන මාසය ඇතුළත සෑම දවස්වල සවසට තේවාව කරන සංඝයා නමට මල්වට්ටියක් දීම ද මුරේ සිටින විට සහ ගමන් යන විට ද උදයට කැඳත් දවල්ට හොඳ බත් මාළු ලැබීම ද ය.

**(25) හොරණෑකාර පංගුව-** සෑම අවුරුදු මාසයක් හැර මාසය බැගින් වෙසක් මාසයේ සිට හයමාසයක් ගංගාරාම විහාරේ දවස් පතා කරන තේවා තුනට හොරණෑ පිඹීම හා ඒ කාලේදී රෑ දවල් දෙකෙහි විහාරේ නැවති සිටීම ද සතර මංගල්‍යයට සහ ස්ථානේ කටයුතු කරන ස්ථානගත සංඝයා නමට හොරණෑ පිඹීම ද මුරේ සිටින විට සහ ගමනක් යනවිට උදයට කැඳත් දවල්ට හොඳට බත් මාළු වේලකුත් ලැබීම ද ය.

**(26) හුණුදෙන පංගුව** අවුරුද්දේ එකිනෙක මාසයේදී ගංගාරාම විහාරේ කෑමට යන හුණුවලින් එක මුලකට සේරුවක් බැගින් හුණු මුළු හතරක් මාස්පතා දීම.

**(27) ලුණුදෙන පංගුව** සෑම අවුරුදුවල පෙබරවාරි මාසයේදී හොඳ පිරිසිදු ලුණු සේරු 25ක් සහ ජුලි මාසයේදීත් එපමණට ම ලුණු ගංගාරාම විහාරයට ගෙන ගොස් දීම ය.[29]

**මාත්ගමුව හා සම්බන්ධ රාජකාරි සේවාව**

(28) බෙර පංගුව අවුරුද්ද මුළුල්ලේ සෑම පෝදාට ම පමණක් තේවාව තුනට බෙර ගැසීමට මිනිහෙක් දීම ද ඒ වැඩ රාජකාරිය කරන්නාට දවාලට බත් මාළු වේලක් බැගින් දවස් පතා ලැබීම ද නියම කළ විට විහාරයේ අලුත් වැඩියා කිරීමට උදව් වීම ය.[30]

**මාවිල්මඩ හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(29) මාළුමුරේ පංගුව** ගංගාරාම විහාරයේ තේවාව කරන සංඝයා නමට අවුරුද්දේ සෑම දවස්වල මාළු තුනකට එළවළු දීම ය.

**(30) මුල්තැන් පංගුව** එකමුරයකට දාවල් පහළොහකුත් රෑ පහළොහකුත් බැගින් අවුරුද්දකට මුර හතරක් ගංගාරාම විහාරේ සිටිමින් අලුයම කැඳ සහ උදයට බත් මාළු ආහාර පූජාවත් උදව් කිරීම ද මුරේ සිටින විට දවස්පතා මල් බන්දේසි දෙකක් පූජා කිරීම ද නිලකාරයට උදයට හා දවාලට කෑම ලැබෙනවා.

**(31) මල්මුරේ පංගුව** එකමුරයට නිතිපතා දවල් දහයකුත් රෑ දහය බැගින් අවුරුද්දකට මුර හයක් ගංගාරාම විහාර මුර සිටිමින් තේවාව කරන සංඝයා නමට උදයට මල් වට්ටි තුනකුත් සවසට මල් වට්ටියකුත් බැගින් දීම ද විහාරේ රෑට සිට මුර කිරීම ද මුරය කරන විට උදයට කැඳත් දවාලට බත් මාළුත් ලැබෙනවා.[31]

**සියඹලාගස්තැන්න හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(32) මල්මුරේ පංගුව** වෙසක් මාසයේ සිට පටන් ගෙන මාසයක් ඇර මාසයකදී පිට පිට දවස් 15 බැගින් අවුරුද්දකට මුර හයක් ගංගාරාම විහාරේ රෑ දවල් මුර කිරීම. පංගුකාරයට දවාලේ සිට සවස හතර හමාරට මල් කඩා ගන හැරී එන වෙලාව වන තුරු නිවාඩු තිබේනවා ය. මුරේ සිටින විට තේවාව කරන සංඝයා නමට උදයට මල්වට්ටියකුත් සවසට මල් වට්ටියකුත් දීම ද විහාරේ මළුව සහ මිදුල් ශුද්ධ පවිත්‍ර කිරීම ද, රෑට සිට මුර කිරීම ද මුරේ සිටින මුරකාරයාට උදයට කැඳත් දවල්ට හොඳට බත් මාළු වේලකුත් ලැබේනවා ය.

**(33) මුල්තැන් පංගුව** එකමුරේට පහළොව බැගින් අවුරුද්දකට මුර හතරක් එනම් දවාලේ සිට සවස හතර වනතුරු තිබෙන නිවාඩුව ඇරෙද්දී රෑ දවල් ගංගාරාම විහාරේ මුරේ සිටිමින් උදෑසන කැඳ ඉවීම හා මහා දානේ ඉවීම ද මුරය කරන විට උදයට කැඳත් දවලට බත් මාළු වේලකුත් ලැබේනවා ය.

**(34) හබාකොටන පංගුව** ගංගාරාම විහාරයේ මාසයට පැලක් බැගින් කොටා හාල් නැලි 25ක් විහාරයට බාරදීම ද අලුත් හාල් මංගල්‍යයට එළවලු කඳක් විහාරයට දීම ද වසරකට වතාවක් නොවැඩි වූ ගණනකදී ගමන්වලදී ඕනෑ කළොත් ස්ථානගත සංඝයගේ දෝලාව මධ්‍යම පළාතේ ඇතුළත ඉසිලීම ද ය.

**(35) ලුණු දෙන පංගුව** සෑම අලුත් බක් මාසයේදී ගංගාරාම විහාරයට හොඳ පිරිසිදු ලුණුවලින් සේරු 40 දීමය.[32]

**සිරිමල්වත්ත හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(36) මුල්තැන් පංගුව** එකමුරයකට පහළොව බැගින් මුර හතරක් නානුමුර මංගල්‍යය හා අලුත් අවුරුදු මංගල්‍යය දෙදවසෙත් ගංගාරාම විහාරෙ මුල් තැන් රාජකාරියට මිනිහෙක් දීම ද ඒ රාජකාරි කරන්නා විසින් උදේ තේවාවටත් මහා දානේ තේවාවටත් අහාර පූජාවට ඉවීම ද මංගල්‍යය දවස්වල ඇර අනික් දවස්වල විහාරේ මුරේ සිටීම ද උදයට කැඳත් දවලට බත් මාළු ලැබීම ද ය.

**(37) හොරණෑ පංගුව** මාසයක් ඇර මාසය බැගින් බක් මාසේ සිට පටන් ගෙන අවුරුද්දකට හය මාසයක් තේවාව තුනට හොරණෑ පිඹීමට මිනිහෙක් දීම ය. මුරේට යන මිනිහා මුර කරන විට සැමදා සවස තේවාවට විහාරයට ගොස් පසුවදා, මහදානේ තේවාවට පසු බත් කෑමට ගෙදර යනවා ය. ඔහුට විහාරෙන් ලැබෙන්නේ කැඳ පමණි.[33]

**හාල් මැහිකඳුර (යටිනුවර) හා සම්බන්ධ රාජකාරි සේවාව**

**(38) නිලපංගුව** අත්හැර දැම්මා.

**(39) නිල පංගුව** අලුත් අවුරුදු මංගල්‍යයට පසු කඩිනමින් නානුමුර මංගල්‍යයට ගංගාරාම විහාරේ ස්ථානගත සංඝයා නමට එළවළු කදක් දීම ද සතර මංගල්‍යයට එකිනෙකට වී අමුණ බැගින් සේම විහාර මුනක් කොටා හාල් ද මුනක් දීම ද මෙම වැඩ රාජකාරියට මාත් සියවස යෙන්ග හා රාම විහාරෙදී කොටන්නට භාර දෙන වී එක අමුණකට වී අට ලාහක් බැගින් විහාරෙට ලැබීම ද ඒ ස්ථානයට ගෙන ගොස් හාල් බාර දීම ද ය.[34]

ගංගාරාම සෙල්ලිපියෙන් පමණක් නොව මධ්‍යම පළාත පිළිබඳ වැදගත් තොරතුරු රැසක් සඳහන් කරන ඒ.සී. ලෝරිගේ වාර්තාවේ ද ගංගාරාම විහාරය සතු ඉඩම් ගැන සඳහන් කරයි. තල්වත්ත, වට්ටාරන්තැන්න, මාවිල්මඩ, සිරිමල්වත්ත, සියඹලාගස්තැන්න, මාපනාවතුර, අරප්පල, හාල්මැහිකඳුර, මාත්ගොමුව, නාපාන සහ තැන්නේකුඹුර, කැගල්ලේ දියගම සහ දහුන්පහුව වැනි ප්‍රදේශවල ඉඩකඩම් මෙම විහාරයට පැවති බව පෙනේ. මෙම විහාරයේ කටයුතු සම්බන්ධයෙන් පංගු 52ක් තිබී ඇත. ලෝරිගේ වාර්තාවට අනුව කුඹුරු අක්කර 45ක් ගෙවතු ඉඩම් අක්කර 34ක් හා හේන් අක්කර 74ක් එවකට පූජා කොට තිබුණු බව සඳහන් වේ. මහනුවර ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ඇති ප්‍රවේණි ලේඛනයේ ඒ ඒ ප්‍රදේශ කේන්ද්‍රගතව පවතින පංගු 39ක් පිළිබඳව තොරතුරු සඳහන්ව ඇත. ඒ අතර මුල් තැන් පංගු 6 ද මල්මුරේ පංගු 5 ද හේවිසි පංගු 3 ද නිල පංගු 3 ද ලුණු පංගු 3 ද වලං පංගු 2 හබාකොටන පංගු 2 ද යනාදී වශයෙන් පවතින අතර විශේෂයෙන් මෙම විහාරයෙහි නානු මුර මංගල්‍යය සිදු කරන විට කැඩපත ඇල්ලීම සඳහා පංගුවක් වෙන් කර තිබීම කැපී පෙනේ.

මෙම විහාර කර්මාන්තය ඉදි කිරීමට දායක වූ ශිල්පීන්ට ද රජතුමා විසින් විවිධ ප්‍රදානයන් සිදු කර ඇත. විහාරයේ සිතුවම් ඇඳීමට දායක වූවන් පිළිබඳ විවිධ මතවාද පවතී. නිලගම අබරණ අප්පු, හිරියාලේ නයිදේ හා කැලියල්පිටියේ ගුරුන්නාන්සේ කීර්ති ශ්‍රී රාජසිංහ යෙදවූ බවට අදහසක් පවතී.[35] විචාරක මතය වන්නේ මෙම විහාරයේ චිත්‍ර උඩගම සහ හිරියාලේ සිත්තරුන්ගේ සහයෝගයෙන් ගන්නෝරුවේ ලොකු මුහන්දිරම් නැමැත්තකු කළ බවයි. තවත් අදහසක් වන්නේ විහාරයේ ප්‍රතිමා සහ චිත්‍ර උඩුනුවර අහරණ ආචාරියා විසින් නිම කළ බවයි.[36] මෙවැනි අදහස් පැවතියත් ඒ.සී. ලෝරි සහ එච්.ඩබ්ලියු. කොඩ්රිංටන් පෙන්වා දෙන්නේ ගන්නෝරුවේ ලොකු මුහන්දිරමගේ මූලිකත්වයෙන් නිම කළ බවකි. එවකට විහාර කර්මාන්තය ඉදි කිරීමට දායක වූ ශිල්පීන්ට නිශ්චල හෝ චංචල දේපළ ලබා දුන් බව පෙනේ. විශේෂයෙන් ම විහාරයේ වැඩ කටයුතු

නිම කිරීම වෙනුවෙන් කීර්තී ශ්‍රී රාජසිංහ රජතුමා අලියකු ප්‍රදානය කර තිබේ.[37] රජු විසින් කාර්මිකයිනට කරන ලද විශේෂ සැලකිලි හා වෙනත් ත්‍යාග පිරිනැමීම් අතර රජ ඇඳුමෙහි කොටස් ද ඇතුළත්ව තිබුණු බවත් ගංගාරාම විහාරයෙහි වැඩ කටයුතු කළ ශිල්පියාට ඒ වෙනුවෙන් පුරාණ රජ ඇඳුමක් තැගි කළ බවත් සඳහන් වේ.[38] නගරයට ආසන්න, විහාරය වශයෙන් ගංගාරාම විහාරයේ අභිවෘද්ධියට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් සුවිශේෂ අනුග්‍රහයක් ලැබුණු බව පෙනේ.

---

1 **මහාවංශය**, සංස්. හික්කඩුවේ සුමංගල සහ දොන් අන්ද්‍රිස් සිල්වා බටුවන්තුඩාවේ, පරි. 99 - 100.

2 **සුළුරාජාවලිය**, සංස්. ඩී. පී. ආර්. සමරනායක, පිටු.42-43.

3 **මධ්‍යම ලංකා පුරාවෘත්ත,** සංස්. නාවුල්ලේ ධම්මානන්ද, පිටු. 168 - 206.

4 Siriweera, W.I. “The Theory of Kins's Ownership of Land in Ceylon” **Journal of Historical and Social Studies ,Vol**. 1,P. 51.

5 Codrington , H.W. **Ancient Land Tenure and Revenue in Ceylon** , P. 5-6.

6 Codrington , H.W. **Ancient Land Tenure and Revenue in Ceylon** , P. 52.

7 හෝල්ට්, ජෝන්. **කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආගමික ලෝකය**, පරි. මැද්දේගම, ප්‍රසන්න, උදය, පිටු. 14- 30.

8 Malalgoda,Kirsiri, **Buddhism and Sinhalese Society 1750 – 1900**,P. 258.

9 හොල්ට්, ජෝන්, **කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආගමික ලෝකය**, පරි. උදය ප්‍රසන්න මැද්දේගම,පිටු. 21.

10 විමලරත්න, කේ.ඩී.ජේ. **බ්‍රිතාන්‍යය යටත් ලංකාවේ විහාර ඉඩම් පාලනය**, පිටු. 06.

11 **එම**, පිටු. 7.

12 Lawri A.C. **Gazetter of the Central Province of Ceylon**, P. 812-846.

13 Hans,Dieter, Evers,“**Buddhism and Birtish Colonial Policy in Ceylon**.1515-1875 ”**In Asian Studies Vol.II**, No 3, P. 324.

14 දිසානායක, ජේ.බී. **සිංහල වෙහෙර විහාර**, පිටු. 35.

15 සෝමතිලක, මහින්ද, **කීර්ති ශ්‍රී රාජසිංහ සහ ගංගාරාම රජමහා විහාරය.** පිටු. 45.

16 සෙනවිරත්න,අනුරාධ, **ගෞතම බුද්ධ ශාක්‍යමුණි**, පරි. රතනපාල,දොරණෑගම , පිටු. 24.

17 **මහාවංශය**, සංස්. හික්කඩුවේ සුමංගල සහ දොන් අන්ද්‍රිස් සිල්වා බටුවන්තුඩාවේ, පරි. 100, ගාථා 18 - 217.

18 **සුළුරාජාවලිය**, සංස්. ඩී.පී.ආර්. සමරනායක, පිටු. 47 - 48.

19 සෝමතිලක, මහින්ද. **කීර්ති ශ්‍රී රාජසිංහ සහ ගංගාරාම රජමහා විහාරය.** පිටු. 51.

20 එම, පිටු. 51.

21 **මහාවංශය**, සංස්. හික්කඩුවේ සුමංගල සහ දොන් අන්ද්‍රිස් සිල්වා බටුවන්තුඩාවේ, පරි. 100, ගාථා. 182 - 217.

22 චුම්වොංග්ස්,නන්දන,ප්‍රේමතිලක, ලීලානන්ද, සිල්වා, රෝලන්ඩ්, **ශ්‍රී ලංකාවේ බිතිසිතුවම්,ගංගාරාමය**, පිටු .12.

23 සෝමතිලක, මහින්ද, **කීර්ති ශ්‍රී රාජසිංහ සහ ගංගාරාම රජමහා විහාරය**, (උපුටාගැනීම) පිටු.50-53ග

24 මෙම විහාරයේ සේවාවන් පවත්ගෙන යැමේදී ඉඩම් හා බැඳි රාජකාරි පිළිබඳ ගංගාරාම ශිලා ලිපිය ඇසුරෙන් 1872 ඉංග්‍රීසීන් විසින් ප්‍රවේණි ලේඛනය සකසා ඇත.

25 Lawre, A.C. A. **Gazetteer of the Central Province of Ceylon**, Vol.II, P. 818.

26 **Service Tenures Register Kandy**. Vol. II, P. 20 -30.

27 **Service Tenures Register Kandy**. Vol. II, P. 3 -4.

28 **Service Tenures Register Kandy**. Vol. II, P. 870.

29 **Service Tenures Register Kandy**. Vol. I, P. 7.

30 **Ibid**, P. 228.

31 **Ibid**, P.11.

32 **Service Tenures Register Kandy.**, Vol. I, P. 16.

33 **Ibid,**P. 861.

34 **Service Tenures Register Kandy**. Vol. P.39.

35 චුම්වොංග්ස්,නන්දන,ප්‍රේමතිලක, ලීලානන්ද, සිල්වා, රෝලන්ඩ්, **ශ්‍රී ලංකා බිතු සිතුවම්, ගංගාරාමය**, පිටු.15.

[36] fikúrත්න,අනුරාධ,**ගෞතම බුද්ධ ශාක්‍යමුණි**, පිටු. 26.

[37] Codrinytion ,W.M." The Kandiyan Navandanno” **Journal of the Royal Asiatic Society**, Vol XXI, No 61, 1909. P. 237.

[38] කුමාරස්වාමි, ආනන්ද, **මධ්‍ය කාලීන සිංහල කලා**, පරි. එච්.එච්. සෝමරත්න, පිටු. 60.